# පැණි පුහුල් ගෙඩිය



පියුමංසි උමායා මාපාබණ්ඩාර

# පැණි පුහුල් ගෙඩිය…………



පියුමංසි උමායා මාපාබණ්ඩාර

**ISBN –**

කෘතිය පළ කරන දිනය – **2023.11.15**

කතෘගේ වෙනත් කෘතීන් -

- ඔයාව කවදාවත් අමතක වෙන්නෙ නැහැ
- අපූරු යාළුවෝ

# පිදුම

දිවා රෑ වෙහෙසී මගේ අනාගතය වෙනුවෙන් ඇප කැප වන මගේ ආදරණීය අම්මාට, අප්පච්චීට, සහ මා පුංචි කාලයේ සිට රැක බලාගත් කිරිඅම්මාට, කිරිඅත්තාට සහ මෙම පොත ලිවීමට උනන්දු කර වූ අපේ ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ට සහ අපට පළමු වසරේ සිට දෙවන වසර දක්වා පංති භාරව සිටි අපගේ ආදරණීය ගයනි ගුරු මෑණියන්ටත්, ලහිරු ගුරු මෑණියන්ටත්, සමින්ද ගුරු පියාණන්ට සහ මගේ පංතියේ සියලු ම මිතුරියන්ට පිළිගන්වමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි.එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟ පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් “දිවිය දිනන විද්‍යුත් පොතක් ” ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ “දිවිය දිනන විද්‍යුත් පොතක්” ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර

2023.11.01




ඉස්සර කාලේ එක ගමක ආරච්චි මහත්තයාගේ ගෙදර හිච්චි කියලා මනුස්සයෙක් ජීවත් වුණා. මේ හිච්චි හරියට පොඩි ළමයෙක් වගේ. කියන කිසිම දෙයක් තේරුම් ගන්න බැහැ. දවසක් ආරච්චි මහත්තයා හිච්චිට කිව්වා. "හිච්චි ඉක්මනටම කඩේට ගිහින් පැණි පුහුල් ගෙඩියක් අරන් එන්න."

එහෙම කියලා ආරච්චි මහත්තයා හිච්චිට පනම් පහකුත් දුන්නා. ඉතින් හිච්චි මේ පනම් පහ



අරගෙන පැණි පුහුල් ගෙඩියක් ගේන්න ගියා. මේ ගමේ හිටියා කිතුල් මල කපන පියසේන මාමා. හිච්චි මුලින් ම ගියේ පියසේන මාමලාගේ ගෙදරට. ගිහිල්ලා පියසේන මාමාට කිව්වා .

"ආරච්චි මහත්තයා කිව්වා, පැණි බෝතල් පහක් අරන් එන්න කියලා."




ඉතින් පියසේන මාමා හිච්චිට පැණි බෝතල් පහක් දුන්නා. හිච්චි පියසේන මාමාට පනම් පහක් දුන්නා. ඊට පස්සේ හිච්චි ගියේ ගමරාල



## මාමාලාගේ ගෙදර.


ඒ වෙලාවේ ගමරාල මාමා ගෙදර හිටියේ නැහැ. ගම හාමිනේ විතරයි හිටියේ. ගම හාමිනේගෙ කන් දෙක පොඩ්ඩක් ඇහෙනවා අඩුයි. හිච්චි, ගම හාමිනේට කිව්වා "ආරච්චි මහත්තයා කිව්වා, පුහුල් ගෙඩියක් අරන් එන්න කියලා." ගම හාමිනේට මේක ඇහුනේ "හුල් ගෙඩියක් අරන් එන්න." කිව්වා වගේ. ඉතිං ගම හාමිනේ මොකක්ද මේ "හුල් ගෙඩියක් කියන්නේ" කියලා ඇහුවා. ඔය අතරේ ගමරාල ගෙදර ආවා. ගම

හාමිනේ ගමරාලට කිව්වා. "මෙන්න මේ හිච්චියාට හුල් ගෙඩියක් ඕන" කියලා. ගමරාලත් මොකක්ද මේ හුල් ගෙඩිය කියලා ඇහුවා.



කුස්සියෙත් හෙවුවා. වත්තෙත් හෙවුවා. එළවළු කොරටුවෙත් හෙවුවා. ඒත් හොයා ගන්න බැරි වුණා. ඔහොම ටිකක් වෙලා ගියාට පස්සෙ ගමරාල හිච්චිගෙන්

ඇහුවා. හිච්චි,මොකක්ද ඔය හුල් ගෙඩිය" කියලා. එතකොට හිච්චි කිව්වා "හුල් ගෙඩියක් නෙමෙයි ගමරාල. පුහුල් ගෙඩියක්." කියලා. ඉතින් ගමරාලට හොඳටම කේන්ති. ඒත් ඉතිං ආරච්චි මහත්තයාගෙන් බැනුම් අහන්න වෙයි කියලා හිතලා ගමරාල ඉක්මනටම එළවළු කොරටුවට ගිහින් ලොකු ම ලොකු පුහුල්



ගෙඩියක් අරන් ආවා. හිච්චි පුහුල් ගෙඩියයි, පැණි බෝතල් පහයි අරගෙන ඉක්මනටම ආරච්චි මහත්තයාලගෙ ගෙදරට ගියා.



ඒ වෙලාවෙ ආරච්චි මහත්තයා ගෙදර ඉස්සරහ හාන්සි පුටුවේ හාන්සි වෙලා හිටියේ. හිච්චි දැකපු ආරච්චි මහත්තයාට ලොකු හිනාවක් ගියා. ඒ ලොකු හිනාව ගියේ

අතේ මලු දෙකක් ම තිබුණ නිසා. මොකද දැන් ආරච්චි මහත්තයාට එක පැණි පුහුල් ගෙඩියට පැණි පුහුල් ගෙඩි දෙකක් ම කන්න ලැබෙන නිසා. හිච්චි, ආරච්චි මහත්තයාට මලු දෙක ම දුන්නා. ආරච්චි මහත්තයා මලු දෙක බැලුවා. එකක පැණි බෝතල් පහකුත්, අනෙක් මල්ලේ ලොකු ම ලොකු පුහුල් ගෙඩියක්. මේක දැකපු ආරච්චි මහත්තයාට හොඳටම කේන්ති. ආරච්චි මහත්තයා හිච්චිට කිව්වා.

"මොකක්ද හිච්චි මේ කළුවා මාරපන් ගියා වගේ වැඩක් කරලා තියෙන්නෙ. මම ඔයාට කීවෙ, පැණි පුහුල් ගෙඩියක් ගේන්න කියලා. එහෙම නැතුව පැණි බෝතල් පහකුයි, ලොකු ම ලොකු පුහුල් ගෙඩියකුයි නෙවෙයි. මේ පැණි බෝතල් පහක් කන්න අපේ ගෙදර මී කිරිත් නැහැ.

ඒ වගේ ම මේ ලොකු ම ලොකු පුහුල් ගෙඩිය අපි කන්නේ නැහැ. ඔයා දන්නවනේ අපේ ගෙදර අය

පුහුල් උයලා තියා පුහුල්දෝසි වත් කන් නැති බව."

දැන් ඉතින් මේ පැණි බෝතල් පහ පියසේනට ම ගිහින් දෙන්න මතක් කරලා ම මගේ පනම් පහ ඉල්ලාගෙන එන්න. මේ ලොකු ම ලොකු පුහුල් ගෙඩිය ගමරාලට ම බාර දෙන්න. හෙට උදේ ම මම යනවා පියසේනලාගෙ ගෙදරත්, ගමරාලගෙ ගෙදරත්. ගිහිල්ලා මේ වෙච්ච අත්වැරදීම පැහැදිලි කරනවා. එන ගමන් ලොකුම ලොකු පැණි පුහුල් ගෙඩියක් මම

ගේන්නම්. ඒකෙන් ලොකු ම කෑල්ල ඔයා ම කන්න.

මොකද අත් වැරැද්දක් කරලා හොඳට ම මහන්සිත් ඇතිනේ දැන්. ඉතින් ඉක්මනට පුහුල් ගෙඩියයි, පැණි බෝතලුයි අයිතිකාරයන්ට ම දීලා එන්න."

හිච්චි හනිකට ගමරාලගේ ගෙදරටත් පියසේනලාගෙ ගෙදරටත් ගිහිල්ලා, පැණි බෝතල් ටිකත් දීලා, පුහුල් ගෙඩියත් දීලා පස්ස නොබලා ගෙදර ආවා.



ඊළඟ දවසේ ආරච්චි මහත්තයා ගමේ කඩේට ගිහින් ලොකු ම ලොකු පැණි පුහුල් ගෙඩියක් ගෙනාවා. යන ගමන් පියසේන මාමාගෙ ගෙදරත් ගමරාලලාගේ ගෙදරත් යන්න අමතක කළේ නැහැ. පැණි පුහුල් ගෙඩියෙන්

ලොකුම කැල්ල හම්බ වුණෙත් හිච්චිට.



## පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ  ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන කාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු....

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01